# නවතම සිනමා අත්දැකීමට ටීගෝ අනුග්‍රහය

ශ්‍රී ලංකාවේ පළමු වතාවට නර්තන තරු රැසක් පිරිවරා කරන සිනමා අත්දැකීම ඔබ වෙත ගෙන ඒමට පූර්ණ අනුග්‍රහය දක්වන්නේ ටීගෝ පෞද්ගලික සමාගමයි. සිරස ඩාන්සින් ස්ටාර් නර්තන ප්‍රසංගයට ප්‍රථමවරට සහභාගි වූ නර්තන තරු රැස සමගින් මෙම සිනමාපටය නිෂ්පාදනය කර තිබෙන අතර මෙම නවතම ආරේ සිනමා අත්දැකීම කාගේත් කතාබහට ලක්වනු නොඅනුමානයි.

මෙහිදී ප්‍රථම වරට මෙම සිනමාපටයේ අඩංගු දේ ඩවුන්ලෝඩ් කර ගැනීමේ අවස්ථාව හිමි වන්නේ ටීගෝ පාරිභෝගිකයන්ටයි. ඒවා අතර ටීගෝ කෝල් අ ටියුන් (රින්ගින් ටෝන්ස්) තත්. 30 MP3/UrE ටෝන්ස්/මොනො ටෝන්ස්, වොල් පේපර්ස්, ඇනිමේෂන්ස්/තීම්ස්

සිනමාපටය ආරම්භ වන්නේ ඩාන්සින් ස්ටාර්ස් තරගකරුවන් හැටියට නර්තන තරුවන් සිය ගමන ආරම්භ කළ සැටියි. ඔවුන්ගේ ජීවන රටාවයි .ටීගෝ ද තැරුණ තරුණියන්ගේ මෙන්ම හදවතින් තරුණ මිනිසුන්ගේ ජීවන රටාව සමග කරට කර බැඳී පවතින බැවින් ඔබට මෙම සිනමා පටය අලුත්ම අත්දැකීමක් වන බව සහතිකයි. ද ඩාන්සින් ස්ටාර්ස් 2009 පෙබරවාරි 12 වන දින මංගල දැක්ම එළිදක්වන අතර දිවයින පුරා සිනමා හල් 35 කට අධික ප්‍රමාණයක මෙම සිනමාපටය තිරගත වීමට නියමිතයි.

මෙම සිනමාපටයේ ගීත අඩංගු තැටියක් ජනවාරි 28 වන දින එළිදැක්වූ අතර මේ සඳහා ප්‍රධාන නිල අනුග්‍රහය දක්වන ටීගෝ සමාගම වෙත ගී තැටි 10000 ක් තිළිණ කරන ලදී. අලුත් ටීගෝ පාරිභෝගිකයන්වද 2009 ජනවාරි 28 සිට පෙබරවාරි 28 දක්වා කාලය තුළ මෙම ගී තැටිවලින් 7500 ක් දිනා ගැනිමට දත් අවස්ථාවක් ලැබී තිබේ. ඒ අතරම පැරැණි ටීගෝ පාරිභෝගිකයන්ට ද 2500 ක් දිනා ගැනීමට සහ ගීත ඩවුන්ලෝඩ් කර ගැනීමේ අවස්ථාවක් මෙම කාලය තුළ හිමි වේ. එනිසා ඉක්මන් කර මෙම සිනමාපටය නරඹා ඔබේ ගී තැටියත් හිමි කර ගන්න. එමෙන්ම මෙම සිනමාපටයේ එන ගීත 12 ක් තම ජංගම දුරකථනයට ඩවුන්ලෝඩ් කර ගැනීමේ විශේෂ අවස්ථාවද හිමි වන්නේ ටීගෝ පාරිභෝගිකයන්ටම පමණි. ටීගෝහි ප්‍රධාන විධායක නිලධාරී දුමින්ද රත්නායක මහතා පවසන පරිදි පාරිභෝගිකයා සතුටින් තැබීම ඔවුන්ගේ ඉහළම වගකීමක් සහ යුතුකමකි. ඔවුන් ඒ යුතුකම මැනවින් ඉටු කරමින් පවතී.